විදේශගත ශ්‍රී ලාංකිකයන්ගේ සම්මේලනය
Federation of Expatriate Sri Lankans

ප්‍රිය මහතාණෙනි / මහත්මියනි,

ශ්‍රී ලංකාවේ භෞමික අඛණ්ඩතාවය හා ඒකීය භාවය මෙන්ම එක්සත් භාවය ශ්‍රී ලංකාව තුළ මෙන්ම විදේශීය රටවල පවා ස්ථාපිත කර ගැනීමට දැඩි ආත්ම ශක්තියකින්ද දේශ හිතෛශී භාවයකින් ද යුක්තව සටන් වැදුනු සංවිධාන කිහිපයක කාලීන එකමුතුවකි මෙය. එක වහලක් යටට ගෙන ඇති මෙම එකමුතුව නමින් "විදේශගත ශ්‍රී ලාංකිකයන්ගේ සම්මේලනය" (Federation of Expatriate Sri Lankans) වන අතර රට, ජාතිය, ආගම නිරන්තරයෙන්ම පෙරටු කරගෙන අධිෂ්ඨානයෙන් යුක්තව සිතන ඡන්ද අපේක්ෂකයකු වන ඔබ අප සංවිධානය (FESL) සමඟ එකතු වී දීර්ඝ කාලීනව කටයුතු කිරීමට කැමැත්තක් දරන්නේ නම් "දේශ හිතෛශී ශ්‍රී ලාංකික එකමුතුව" සමඟ එකතුවීමට ස්තුති පූර්වකව ඔබට ආරාධනා කිරීමට කැමැත්තෙමු.

ජාතික හෙළ දරුවන්ගේ අභිප්‍රායන් හොඳින් තේරුම් ගෙන ඒ අනුව ම කටයුතු කිරීමට ප්‍රතිඥා දී සිටින ඔබ ඉතා නුදුරු දිනයකදී ශ්‍රී ලංකාවේදී පැවැත්වීමට නියමිත 2020 මහ මැතිවරණය සඳහා ඔබගේ ඡන්ද අපේක්ෂකත්වය අප විසින් දැඩි පරිශ්‍රමයක් යොදා තෝරා ගැනීමෙන් පසු "විදේශගත ශ්‍රී ලාංකිකයන්ගේ සම්මේලනය" (FESL) ඉතා ඉහළින්ම අනුමත කරන බව ඉතා සතුටින් දැනුම් දෙමු.

නොබැඳි විදේශ ප්‍රතිපත්තියක් හා පරිසර හිතකාමී ආර්ථිකයක් තුළ ප්‍රතිපත්ති පූර්වකව බැඳී සිටින අප අත්‍යවශ්‍යයෙන්ම හෙළ දරුවන්ගේ මෙන්ම හෙළදිවේ උරුමයන් හා ඒකීය භාවය ආරක්ෂා කර ගැනීමට දැඩි ලෙස බැඳී සිටිමු. ශ්‍රී ලංකාවේ හෙම්බත් වී සිටින ඡන්ද දායකයින් තව දුරටත් අල්ලස්, අගතිගාමී ඥාති සංග්‍රහයන් හා දේශපාලන වංචාවන් ඔවුන්ගේ නියෝජිතයන්ගෙන් අපේක්ෂා නොකරන නිසාම අප ද ඉතාමත් නොකැළැල් පරිපාලන පද්ධතියක් අපේක්ෂා කරන බැවින් ද ඉහත සඳහන් දූෂිත කරුණු තරයේම හෙලා දකිමු.

ඔබගේ අනුදැනුම හා අනුමැතිය සහිතව සමාජ මාධ්‍ය ජාලා ව්‍යාපෘතිද, මැතිවරණ ව්‍යාපාරයේ අත් පත්‍රිකා මුද්‍රණය කිරීම අදාල පුවත් හා තොරතුරු නිකුත් කිරීම ද සලකා බැලිය හැක. මෙවැනි ක්‍රියාදාම තුළින් ඡන්ද දායකයින් අතර ඔබගේ ප්‍රතිරූපය ඉතා ඉහළට නැගෙන බවට ඔබ නිසැකයෙන් ම අප සමඟ එකඟ වනවා සේම වැඩි වැඩියෙන් ඡන්ද දායකයින් ඔබ වෙත ආකර්ෂණය වීම ද නිසැකය.

මහමැතිවරණයේදී අප එකමුතුවේ පූර්ණ සහය සහ මැතිවරණයෙන් පසුව අවශ්‍ය පරිදි අප සාමාජිකත්වයේ ප්‍රවීනතාවයන් මගින් දිය හැකි උපරිම සහය ලැබෙන අපේක්ෂයෙකු වශයෙන් පහත දැක්වෙන පාලන යෝජනාවලිය වෙත ඔබගේ කාරුණික අවධානය යොමුවන්නේනම් ස්තුතිවන්ත වෙමු.

1. ශ්‍රී ලංකාවේ ඒකීය භාවය ආරක්ෂා කර ගැනීමට ගත යුතු සියලුම ක්‍රියාමාර්ග ගැනීම.

2. ත්‍රස්තවාදී, බෙදුම්වාදී හා අන්තවාදී ව්‍යාපාර සියල්ලම වැළැක්වීම සඳහා බලසම්පන්න ආරක්ෂක ආයතන හා දැඩි දේශ සීමා ආරක්ෂක ප්‍රතිපත්තියක් පවත්වාගෙන යමින් රජය අස්ථාවර කිරීම, නිශේධ කිරීම. ත්‍රස්තවාදය ව්‍යාප්ත කිරීම සඳහාම ශ්‍රී ලංකාවට ඇතුල්වන විදේශිකයින් වැලැක්වීම, යුධ ආයුධ හෝ විෂසහිත ජීව විද්‍යාත්මක ප්‍රතික්‍රියාකාරකයන් ත්‍රස්ත නියෝජිතයන් විසින් අපනයනය කිරීම තදින්ම වැලැක්වීම හා මෙවැනි වරද වලට දඬුවම ලෙස ස්ථිරවම මරණීය දණ්ඩනය ක්‍රියාත්මක කරවීම.

3. බෙදුම්වාදී හා අන්තගාමී දේශීය මෙන්ම විදේශීය සංවිධාන වල හා දේශීය හා විදේශීය රාජ්‍ය නොවන සංවිධාන වලින් එල්ල වන කිසිම පදනමකින් තොර චෝදනා වලින් ශ්‍රී ලංකාවේ විරෝධාර ත්‍රිවිධ හමුදා භටයින් දැඩි ලෙස ආරක්ෂා කර ගැනීම.

4. ශ්‍රී ලංකාවේ සිංහල බෞද්ධ ශිෂ්ඨාචාරය ගොඩනැගූ බහුතර සිංහල බෞද්ධ ජනතාවගේ සංස්කෘතිය හා අනෙකුත් ප්‍රජා අයිතිවාසිකම් අකුරටම ආරක්ෂා කරන අතර කවදාටත් ශ්‍රී ලාංකීය සුළුතර ජනතාව ඔවුන්ගේ ආගමික හා අනෙකුත් ප්‍රජා අයිතිවාසිකම් දැනට මෙන් ඉදිරියටත් පවත්වාගෙන යෑම ගැන වගබලා ගැනීම හා මෙම සුළු ජාතීන් ද ශ්‍රී ලංකාවේ පොදු නීති සංග්‍රයකට යටත් කරවීම.

5. සියලුම පැතිකඩයන් ආවරණය වන පරිදි ඉතා ශක්තිමත් ජාතික සැලැස්මක් සම්පාදනය කර ගැනීම සඳහා ලහි ලහියේ කටයුතු කිරීම මෙන්ම එම සැලැස්මට අනුව කටයුතු කිරීමට දැඩි ලෙස අධිෂ්ඨාන කර ගැනීම.

i. අප රටේ ස්වෛරීත්වයට හා ආර්ථික තර්ජනයන්ට යටත්වීමට සිදුවන පරිදි ජාත්‍යන්තර පරිමාණයෙන් එල්ල වන අප රටට ඉතා අවාසිදායක ආර්ථික ප්‍රතිපත්ති වැළඳගැනීම වෙනුවට අපගේ ජාතික ආර්ථිකය ශක්තිමත් දේශීය පදනමක් මත පිහිටුවා කටයුතු කිරීම. සීඝ්‍ර ලෙස ඉහළ යමින් පවතින ජීවන වියදම පාලනය කිරීම පිණිස අප රටට අයත් ඉතා අගනා ජාතික වත්කම් පිටරැටියන්ට හෝ විදේශීය සංවිධාන වලට විකිණීම සම්පූර්ණයෙන් වැළැක්වීමට කටයුතු කිරීම.

ii. ශ්‍රී ලංකාවේ ජාතික රාමුවක් තුල සුදුසු ආකාරයකට අපගේ ජාතික අධ්‍යාපන ක්‍රමය වෙනස් කිරීම හෝ නව අදහස් ඉදිරිපත් කිරීම. අත්‍යවශ්‍යයෙන්ම සියලුම ශ්‍රී ලාංකික සිසු සිසුවියන්ට තම තමුන්ගේ ආත්ම අගයන්, ජාතික ජයග්‍රහණයන් හා විශේෂයෙන්ම අප රටේ ජාතික ඉතිහාසය ජාති හෝ ආගමික භේදයකින් තොරව ඉගැන්වීම. ජාති හෝ ලිංග භේද අනුව සිසු සිසුවියන්ව වෙන්කර ඉගැන්වීමේ ආයතන හරහා අන්තවාදී අදහස් ඇති කරවීමේ ක්‍රියාමාර්ගය නැවැත්වීම. විශේෂයෙන්ම විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන වල පවතින අමනෝඥ නවක වද සම්පූර්ණයෙන් ම බැහැර කිරීම සඳහා නව අණපනත් ස්ථාපිත කිරීමෙන් පරිපාලන කටයුතු වලට සහන සැලැස්වීම.

ශ්‍රී ලංකාවේ පවතින ජාත්‍යන්තර පාසල් සියල්ලම රජයේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නීති රීති වලට අනුව පැවැත්වීම හා අප රටේ පවතින ගාම්භීර ඉතිහාසය ඇතුළත්ව රජයේ පාසැල්වල ඉගැන්වෙන ඉතිහාසය විෂය නිර්දේශයට අනුවම එම පාසැල්වල ද ඉගැන්විය යුතුය.

සියලුම සිසු සිසුවියන්ගේ මනසට කාවැද්දවිය යුතු ප්‍රධාන කරුණක් වන්නේ ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය ලබන සියලුම සිසු සිසුවියන්ගෙන් මෙන්ම ශ්‍රී ලාංකීය ජනග්‍රහණයෙන් 95% ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් භාවිතා කරන භාෂාව සිංහල භාෂාව වන බවයි.

සියවස් ගණනාවකට ශ්‍රී ලංකාවේ විනය ගරුක මෙන්ම හැදියාවකින් යුත් ජනතාවක් බිහිකර ගැනීමට විශාල මෙහෙවරක් කළ පිරිවෙන් අධ්‍යාපනයේ ප්‍රතිසංවිධානයක් තුළින් නැවත පණගැන්වීම. තවදුරටත් අයවැය හරහාම හෙළ වෙදකම හා ආහාර විද්‍යාව ක්‍රමානුකූලව ඉගැන්වීම සඳහා ප්‍රතිපාදන සැපයීම.

iii. ශ්‍රී ලංකාවේ පරිහානියට පත්වීගෙන යන පරිසරය හා බරපතල වන සංහාරයන්ට ගොදුරු වීමෙන් අපට ඉතිරිව ඇති අමිල වන ආවරණය දැඩි නීති පැනවීමෙන් වහ වහාම ආරක්ෂා කරගැනීම. එමෙන්ම පරිසරයටම අදාළ පස, වාතය හා ජලය දූෂණය වීම අවම කිරීමට පියවර ගන්නා අතර නව්‍යකරණය කළහැකි බලශක්ති පද්ධතියක් ස්ථාපිත කිරීම.

6. 13 වැනි හා 19 වැනි ව්‍යවස්ථා සංශෝධන අහෝසි කර දැමීමට අවශ්‍ය කරන සැලසුම් - සම්පාදනය කිරීම.

7. අලුතෙන් පත්වන මැති ඇමැතිවරුන්ගේ බලතල අවභාවිතා නොකිරීම මෙන්ම අගතිගාමී ඥාති සංග්‍රහයන්ගෙන් වැළකීම ද වංචා හා දූෂණ අවම කිරීමට වඩා සම්පූර්ණයෙන්ම නවතා දැමීමට කටයුතු කිරීම.

8. මත්පැන් බලපත්‍ර සීමා කිරීමෙන් මද්‍යසාරවලට ඇබ්බැහි වීම හැකි තරම් දුරට පාලනය කිරීම ද හානිකර මත්ද්‍රව්‍ය වැනි දෑ හොර රහසේ අප දූපතට ගෙනඒම හා බෙදාහැරීම මෙන්ම දුම්වැටි පරිහරණය දැඩි ලෙස තවදුරටත් පාලනය කිරීම.

9. විශේෂයෙන්ම උතුරු නැගෙනහිර පළාත්වල ඇති කැණීම් නොකරන ලද මෙන්ම කරන ලද පුරාවිද්‍යාත්මක ස්ථාන ඉදිරි පරම්පරාවලට දායාද කිරීම පිණිස ප්‍රායෝගික ක්‍රියා මාර්ග ගැනීම.

අපගේ අසිරිමත් නිජභූමියේ දීර්ඝ කාලීන ඇවතුම් පැවතුම් වෙනුවෙන් ක්‍රියාත්මක වීමේ අටියෙන් "විදේශගත ශ්‍රී ලාංකිකයන්ගේ සම්මේලනය" (FESL) විසින් ඉතා කල්පනාකාරීව තෝරා බේරාගෙන ඔබ වෙත ඉදිරිපත් කර ඇති ආරාධනය පිළිගැනීමට ඔබේ කැමැත්ත/අකමැත්ත අප වෙත කඩිනමින් දන්වන්න. එවිට ඉදිරියේදී තවදුරටත් ඔබ අපගේ සුහද මුණගැසීම් සහ ක්‍රියාමාර්ග ගැන කටයුතු සම්පාදනය කිරීමට අවකාශ ලැබෙනු ඇත.

එමෙන්ම ඔබ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට මන්ත්‍රීවරයෙක් ලෙස පත්වීමෙන් පසුව අප සංගමය සමඟ විටින් විට මුණගැසී අදහස් හුවමාරු කර ගැනීම ද "විදේශගත ශ්‍රී ලාංකිකයන්ගේ සම්මේලනය" (FESL) විසින් බලාපොරොත්තු වන තවත් වැදගත් කරුණකි.

අවසන් වශයෙන් ඔබ තුමාගෙන්/තුමියගෙන් අප බලාපොරොත්තු වන තවත් ඉතා වැදගත් කරුණක් වන්නේ අප එකමුතුවට සම්බන්දවී ඇති ක්‍රියාකාරී මන්ත්‍රීවරුන් මුණගැසී අපගේ ආදරණීය මව්බිම තවදුරටත් ශක්තිමත් කර ගැනීම පිණිස විශේෂ පීඩනයක් යෙදිය හැකි කණ්ඩායමක් ඇතිකර ගැනීමට සහය වන ලෙසය.

ඔබේ විශ්වාසී වූ,

විදේශගත ශ්‍රී ලාංකිකයන්ගේ සම්මේලනය